# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2023

## 6 ශ්‍රේණිය

**සිංහල භාෂාව හා සාහිත්‍යය කාලය :පැය 2**

නම:.................................................................................................................................................

### 1 කොටස

සැලකිය යුතුයි :

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- ඉරි ඇඳි පදයට වඩාත් ගැළපෙන අර්ථය සහිත යෙදුම තෝරන්න.

01)<u>සුදහ ගින්දරේ</u> පසුවන වැද්දන්ගේ බඩට උවමනා කරන්නේ රසයට වඩා ආහාර ප්‍රමාණය වැඩිවීමකි.

1 බඩගින්නෙන් 2. වේදනාවෙන් 3. වෙහෙසවීමෙන් 4. දැඩි උණුසුමෙන්

02) ගොවිතැන් සඳහා මුදල් වියදම් කිරීම <u>ගඟට ඉනි කැපීමක්</u> යැයි ගොවියෝ පවසති .

1. ස්ථිර පැවැත්මක් ඇති දෙයකි
2. උපරිම සතුටක් ලැබෙන දෙයකි.
3. නිෂ්ප්‍රයෝජන දෙයකි.
4. අධික ලාභයක් ලැබෙන දෙයකි.

03) සිංහල අක්ෂර මාලාව බෙදෙන ප්‍රධාන කොටස් දෙක කුමක්ද ?

1. අල්පප්‍රාණ හා මහාප්‍රාණ
2. ස්වර සහ ව්‍යඤ්ජන
3. ව්‍යඤ්ජන හා සඤ්ඤක
4. මහාප්‍රාණ හා ස්වර

04) පහත දැක්වෙන වචනවල ස්වර හා ව්‍යඤ්ජන නිසිලෙස ගළපා ඇති වරණය වන්නේ,

1. තක්සලාව → ත් + අ , ක් , ස් +අ , ල් + ආ , ව් + අ
2. අරලිය → අ , ර්+ අ , ල් + ඉ, ය් + ආ
3. මාලය → ම් + අ , ල් + අ , ය් + අ
4. කිරිල්ලී → ක් + ඉ , ර් + ඉ +,ල් + අ , ල් + ඊ

05) “පෞද්ගලික” යන වචනයෙහි පිල්ලම් අනුපිළිවෙළින් දක්වා ඇති පිළිතුර තෝරන්න.

1. හල්කිරීම, ගයනුකිත්ත, කොම්බුව, ඉස්පිල්ල
2. කොම්බුව, හල්කිරීම, ඉස්පිල්ල, ගයනුකිත්ත
3. කොම්බුව, ගයනුකිත්ත, හල්කිරීම, ඉස්පිල්ල
4. කොම්බුව, හල්කිරීම, ගයනුකිත්ත, ඉස්පිල්ල.

06) මහාප්‍රාණ අක්ෂරයක් යෙදී ඇති වරණය තෝරන්න

1.ලේඛනය 2. මේසය 3. වාර්තාව 4. ශිෂ්‍යයා

07) නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වචනය තෝරන්න.

1. ප්‍රතිපල 2. පුස්ථකාලය, 3. දර්ශකය 4. සාර්තක

08) “ඉර” යන පදයට සමාන පදයක් නොවන්නේ ,

1. දිනකර 2. දිනපති 3. උදාකර 4. තාරපති

09) “උණුසුම ” යන්නෙහි විරුද්ධ පදය වන්නේ,

1. උණුවීම 2. සීතල, 3. ගින්දර 4. ජලය

10) නාම පදය නිවැරදිව හඳුන්වා ඇති වරණය තෝරන්න.

1. වචන භේදයක් සහිත ව කෙනෙකු හඳුන්වන පද
2. යම් කෙනෙකු, දෙයක් , ස්ථානයක්, හෝ ස්වභාවයක් හැඳින්වීමට භාවිත කරන පද
3. ප්‍රාණවාචී අප්‍රාණවාචී භේදය හැඳින්වීමට යොදන පද
4. ස්ථානයක් හෝ ස්වභාවයක් දැක්වීමට භාවිත කරන පද

11) උත්තම පුරුෂයට අයත් ඒකවචන උක්ත පදයකි.

1. ඔහු 2. නුඹ 3, බල්ලා 4. මම

12) ප්‍රථම පුරුෂ බහුවචන අනුක්ත පදයක් වන්නේ ,

1. ළමයි 2. සත්තු 3. ඔවුහු 4. ළමයින්

13) සඤ්ඤක අක්ෂරයක් සහිත වචනය වන්නේ ,

1. කද 2. කැටය 3.කඹය 4. පාඩම

14) අයියා වේගයෙන් බයිසිකලය පැදගෙන ගියේ ය. මෙහි “ වේගයෙන් ” යනු

1. නාම විශේෂණයකි 2. ක්‍රියා විශේෂණයකි. 3. ක්‍රියා පදයකි 4. නාම පදයකි.

15). “නරිබෑනා” නාට්‍ය රචනා කර ඇත්තේ ,

1. එදිරිවීර සරත්චන්ද්‍ර මහතා ය 2.හෙන්රි ජයසේන මහතා ය
3. දයානන්ද ගුණවර්ධන මහතා ය 4. ජයලත් මනෝරත්න මහතා ය.

* හිස්තැන්වලට වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

16). දුම්රිය වේගයෙන් ඉදිරියට ඇදී ...........

1. ගියා ය. 2. ගියේ ය. 3. ගියෝ ය. 4. ගියහ

17). අපි හෙට උදෑසනින් ම ..............................

1. යමි 2. යමු. 3. යන්නෙමි. 4. යන්නේ ය

18). අක්කා ගීතයක් ගායනා.............

1. කළා ය. 2. කළේය 3. කළෝ ය 4. කළහ.

19). “ඇවිදින කොළයාගේ” බිත්තරය සමාන වන්නේ,

1. ඇට වර්ගයකට ය. 2. කුරක්කන්වලට ය 3. කොළයකට ය 4. වී ඇටවලට ය

20). අනේ ! ඔහු කොහේ ගියාද ? මෙම වාක්‍යයෙහි ඇති විරාම ලක්ෂණ පිළිවෙළින් දැක්වෙන්නේ

1. කොමාව සහ දෙතිත
2. ප්‍රශ්නාර්ථය හා පෙරළි කොමාව
3. විස්මයාදී ලකුණ හා ප්‍රශ්නාර්ථය
4. ඇල ඉර හා ප්‍රශ්නාර්ථය

(ලකුණු 2× 20=40)

## 11 කොටස

උපදෙස් : මෙම කොටසේ 01 සහ 02 ප්‍රශ්න අනිවාර්ය වේ. 03, 04, 05, 06 07 ප්‍රශ්නවලින් 03ක් තෝරාගෙන ප්‍රශ්න 05කට පිළිතුරු සපයන්න.

01)ජන කවි පිළිබඳව ඔබ සකස් කර ගත් පොත් පිංච ඇසුරින් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

I. ඔබ සකස් කරන ලද පොත් පිංචට යෙදූ නම කුමක් ද ? (ලකුණු 02)
II. පොත් පිංච සාදා ගැනීම සඳහා යොදාගත් ද්‍රව්‍ය මොනවාද ? (ලකුණු 02)
III. පොත් පිංචට ඇතුළත් කළ කවි වර්ග දෙකක් නම් ලියන්න. (ලකුණු 04)
IV. පොත් පිංච සඳහා ඔබ කවි සොයාගත් ක්‍රම දෙකක් ලියන්න. (ලකුණු 04)
V. පොත් පිංච සකස් කිරීමෙන් ඔබට ලැබුණු ප්‍රයෝජන දෙකක් ලියන්න. (ලකුණු 04) (ලකුණු 16)

02.) පහත සඳහන් මාතෘකා අතරින් එකක් තෝරාගෙන වචන 125කට නොඅඩු රචනයක් ලියන්න.

I. ප්‍රියවචන කතා කරමු.
II. වසංගත රෝගවලින් ආරක්ෂා වෙමු.
III. නිරෝගිභාවය උතුම්ම ලාභයයි.
IV. මා කියවූ රසවත්ම පොත
V. රසගුණ පිරි දේශීය ආහාර

(ලකුණු 14)

03) මෙවර දෙසැම්බර් නිවාඩුවට ඔබ පවුලේ අය විනෝද චාරිකාවක් යාමට අදහස් කරගෙන සිටින බව සිතන්න. එහි දී නැරඹීමට බලාපොරොත්තු වන ස්ථාන පිළිබඳ දන්වා ඔබේ යහළුවෙකුට හෝ යෙහෙළියකට යැවීමට සුදුසු ලිපියක් ලියන්න.

(ලකුණු 10)

04) පහත දැක්වෙන අතීත කාල වාක්‍ය වර්තමාන කාලයට හරවා ලියන්න.

I. මිනිසා දර කැපීමට වනයට ගියේ ය.
II. නුඹ කුමක් සඳහා පාසලට පැමිණියෙහි ද ?
III. තරු පෙළ අහසෙහි බැබළුණි.
IV. අම්මා මිදුල පිරිසිදු කළා ය.
V. සේවකයෝ වෙහෙසී වැඩ කළහ.

(ලකුණු 10)

05) පහත සඳහන් පාඨ උපුටා ගත් ග්‍රන්ථය හා කතුවරයා ලියා දක්වන්න.

| පාඨය | පාඩමේ නම | උපුටා ගත් ග්‍රන්ථය |
|---|---|---|
| I. "කිමෙක්ද දරුවෙනි, පැන් නොබොව්ද ?" | | |
| II. "මගේ පාදයෝ මට වඩා හපන්නුය" | | |
| III. "මේ සතා කොළයක හැඩහුරුකම ගන්නේ කුමකටද ?" | | |
| IV. "මේවා ගස්වලින් කඩා ගන්නා දෙයක් දැ"යි ඇසුවෝලු. | | |
| V. "අම්මේ , අනික් පාර මමත් බෝට්ටුවෙන් යනවා" යි සරත් කෑ ගැසුවේය. | | |

(ලකුණු 10)

06) පහත සඳහන් වැකිවලට සුදුසු අතීත කාල ආඛ්‍යාත පද ලියන්න.

I. උපාසිකාව සිල් .....................
II. රජවරු රට පාලනය ...................
III. නුඹ පාඩම් ..........................
IV. කෝකිලයා මිහිරි ලෙස නාද ..........
V. අක්කා ගෙදර .........................
VI. තාත්තා ගමට ........................
VII. ගුරුවරු ළමයින්ට ......................
VIII. භික්ෂූහු දහම් .....................
IX. බල්ලෝ මස් .................
X. නුඹලා ගමට ......................

(ලකුණු 10)

07. පහත දැක්වෙන කවිය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

තණ්ඩලේ දෙන්න දෙපොළේ දක්කනවා
කටුකැලේ ගාලෙ නො ලිහා වද දෙනවා
හපුතලේ කන්ද දැකලා බඩ දනවා
පව් කළ ගොනෝ ඇදපන් හපුතල් යනවා

ආරන්නේ පඳුර වට කර දලු ලන්ට
පීරන්නේ වරල තෙල් ගා ඹබ වෙන්ට
මෝරන්නේ හඳේ කරුවල වැඩි වෙන්ට
තේරෙන්නේ නැද්ද මේ දුක දෙවියන්ට

I. මෙම ජන කවිය තුළින් සඳහන් වන වෘත්තිය කුමක්ද ?....................................................
II. ගොනා පිළිබඳව කවියා දුක්වන බව හැඟවෙන පද්‍ය පාඨය ලියන්න
III. කවියා පිහිට පතන්නේ කවරෙකුගෙන් ද ?
IV. හඳ මේරීම නිසා සිදුවන දේ කවියා දක්වන්නේ කෙසේ ද ?
V. මෙහි සඳහන් වන කන්ද කුමක්ද ?

(ලකුණු 10)

***